00361

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - පස්වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2022/2023

පරිසර නීතිය – LLU5811/LWU3314

කාලය – පැය 3

දිනය - **2024 මාර්තු 27** වේලාව - පෙ.ව.9.30-ප.ව.12.30

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

අවසර නොලත් ලිපි ලේඛන, ජංගම දුරකථන හෝ වෙනත් විද්‍යුත් උපාංග විභාග ශාලාවේ තබාගැනීම විභාග වරදකි.

පලමු කොටසින් ප්‍රශ්න අංක **1** ට සහ දෙවන කොටසින් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

**I** කොටස – මෙය අනිවාර්ය ප්‍රශ්නයකි (ලකුණු **40**)

1. සෙරන්ඩිබ් හි ආණ්ඩුව රටේ ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීමට සහ සමස්ත ප්‍රවාහන සැලැස්මක් සම්පාදනය කිරීමට තීරණය කරයි. මෙම සැලැස්ම විසින් විවිධ විශාල නගර ඒකාබද්ධ කරන අධිවේගී මාර්ග පද්ධතියක් ඉදිකිරීමට යෝජනා වී ඇත. මේ අනුව එලැඹෙන වසර පහ තුළ බටහිර, දකුණු හා මධ්‍යම පලාත් සම්බන්ධ කරමින් අධිවේගී මාර්ග තුනක් ඉදි කෙරෙනු ඇත.

   මෙම අධිවේගී මාර්ගවල පහත දැක්වෙන පාරිසරික හා සමාජ බලපෑම් පවතී:

   අ) රට පුරා සිටින මිලියනයක් පමණ ජනතාව අවතැන් වීම.
   ආ) කෘෂිකාර්මික හා නිවාස සහිත ඉඩම් ප්‍රමුඛ කොට ගත් ඉඩම් හෙක්ටයාර සිය ගණනක් රජයට පවරා ගැනීම. මෙහි ප්‍රතිඵල ලෙස 200 00 ක ගොවි ජනතාවක් අවතැන් වනු ඇත.

ඇ) අධිවේගී මාර්ග සහ අවතැන් වූ අය යලි පදිංචි කිරීම සඳහා සඳහා හෙක්ටයාර සිය ගණනක කැලෑ බිම් විනාශ කිරීමට නියමිතය. මින් එක් වනාන්තරයක් මෑතක දී හඳුනාගත් දැනට ජීවත්ව සිටින එකම ගෙඹි විශේෂයක වාසභූමිය බවට විශ්වාස කෙරෙයි.

ඈ) රැම්සාර් බිමක් ලෙස නම් කළ තෙත් බිමක් ඔස්සේ අධිවේගී මාර්ග දෙකක් ඉදිකිරීමට නියමිතය. මෙම තෙත්බිම වඳ වී යමින් සිටින පක්ෂී වර්ග කිහිපයක නිජබිම වෙයි. එක් ප්‍රධාන පෙළේ අධිවේගී මාර්ගයක් අලිමංකඩක් හරහා වැටී ඇත.

සෙරන්ඩිබ් රාජ්‍යයේ නීති පද්ධතිය සහ පාරිසරික බලපෑම් තක්සේරු නීතිය ශ්‍රී ලංකාව හා සමානය.

EIA Watch නම් රාජ්‍ය නොවන සංවිධානය මෙම ව්‍යාපෘතිය මහජන සමාලෝචනය සඳහා ඉදිරිපත් කළ අවස්ථාවේ ඒ සම්බන්ධව විරෝධතා ගොනු කොට ඇත. අධිවේගී මාර්ග තුන සඳහා අනුමැතිය දුන් ව්‍යාපෘති අනුමත කිරීමේ ඒජන්සිය මෙම විරෝධතා අධිතීරණය කළේය.

රාජ්‍ය නොවන සංවිධානය අධිවේගී මාර්ත තුන ඉදිකිරීමට ව්‍යාපෘති අනුමත කිරීමේ ඒජන්සිය ගත් තීරණය අභියෝගයට ලක්කිරීමට අදහස් කරන අතර සමස්ත ප්‍රවාහන සැලැස්ම ද අභියෝග කිරීමට අපේක්ෂා කරයි.

එලෙස කළ හැකිද යන්න සහ එසේ කරන්නේ නම්, ඒ කවර පදනම මත දැ 'යි සාකච්ඡා කරන්න.

**2** කොටස – මෙම කොටසින් ප්‍රශ්න තුනක් සඳහා පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු **20** බැගින්)

2. 'මනුශ්‍ය ක්‍රියාකාරකම් නිසා ආපසු හැරවිය නොහැකි ආකාරයට විනාශ නොවූ පෘථිවියක් අනාගත පරම්පරාවන් වෙත දායාද කිරීමේ වගකීම වත්මන් පරම්පරාව සතු වෙයි. පෘථිවියේ භාරකාරත්වය තාවකාලිකව භාර ගනු ලබන සෑම පරම්පරාවක්ම ස්වභාවික සම්පත් සාධාරණ ලෙස භාවිතා කිරීමටත්, පරිසර පද්ධතීන්වලට සිදුකරන විනාශකාරී වෙනස් කිරීම් නිසා ජීවිතය අන්තරායට ලක් නොවන බවටත්, කවර ක්ෂේත්‍රයක වුවද සිදුවන විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුව පෘථිවිය මත වන ජීවය මත හානි ඇති නොකරන බවටත් වග බලා ගැනීමටත් කටයුතු කළ යුතුය.'

*[අනාගත පරම්පරාවන් කෙරෙහි වත්මන් පරම්පරාව සතු වගකීම් පිළිබඳ වූ ප්‍රකාශනය - 4 වන*

වගන්තිය]

අනාගත පරම්පරාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාවේ හා වෙනත් අධිකරණ බල පද්ධතීන් උත්සාහ කොට තිබෙන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කරන්න. නඩු නීතිය ඇසුරින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

3. 'මෑතකාලයේ සම්මත වූ සියලුම ප්‍රධාන පෙළේ පාරිසරික සම්මුතීන් තුලට ධරණීය සංවර්ධනය පිළිබඳ සංකල්පනය ඇතුලත් කොට ගෙන තිබීම සහ ඒ තුළ එම සංකල්පනය පිලිබිඹු වීම ඇතැම් විට වඩාත්ම වැදගත් කරුණ ලෙස සැලකිය හැක'.

[*UNEP* සංවිධානයේ 'පරිසර නීතිය සහ ධරණීය සංවර්ධනය - ඉදිරිය සඳහා අලුත් මගක්]

ඔබ අධ්‍යයනය කොට තිබෙන අන්තර්ජාතික පාරිසරික සම්මුතීන් තුනක් තෝරාගෙන ඒවායේ ප්‍රතිපාදන ධරණීය සංවර්ධනය පිලිබඳ සංකල්පනය ගැඹුරු කිරීමට හේතු වී තිබෙන්නේ කෙසේද යන්න සහ මෙම ආරක්ෂණය මොන තරම් දුරට ප්‍රතිඵලදායක ද යන්න සාකච්ඡා කරන්න. ශ්‍රී ලංකාව බඳු රටවල තත්වය කෙරෙහි ඔබ විශේෂයෙන් අවධානය යොමු කළ යුතු වෙයි.

4. මහනගර නම් නගරයේ පිහිටි ෆැක්ටරිවත්ත නම් වූ අඩු ආදායම්ලාභී ජනාවාසය 100 000 ක ජනතාවකගෙන් සමන්විත වෙයි. ෆැක්ටරිවත්ත නිර්මාණය වූයේ රසායනික කර්මාන්තශාලාවක් වටාය. එමගින් එහි වැසියන් භාගයකට පමණ අඩු මට්ටමේ වැටුප් සහිත රැකියා ලැබී ඇත. මෙම ජනයා සිය නිවාස කර්මාන්තශාලාවට ආසන්නව ඉදි කොට තිබෙන අතර ෆැක්ටරියට ආසන්න සීමාවක් තුළ සනීපාරක්ෂාව, පිරිසිදු පානීය ජලය සඳහා වූ ප්‍රවේශය හෝ නිසි අපජල කළමණාකරන පද්ධතියක් බඳු වූ මූලික පහසුකම් හෝ රහිතව ජීවත් වෙති. මීට අමතරව, ෆැක්ටරිය වෙතින් මතු වන පාරිසරික දූෂණය නිසා අසල්වැසි ප්‍රදේශයේ ජීවත් වන ළමුන් තුළ ශ්වසන රෝග ඇති වී ඇත. ෆැක්ටරිය පසු කොට යන ඇළ පාර මෙම ජනයා විසින් නෑම හා බීම සඳහා ජලය සපයා ගැනීමට යොදා ගන්නා අතර එය ද දූෂණයට ලක්ව තිබේ.

කර්මාන්තශාලාව නිසා මහජන පීඩාවක් ඇතිව තිබෙන බව හා එය අවට වූ ජනතාව කෙරෙහි සෞඛ්‍යමය වශයෙන් අන්තරාදායක බවට වූ පදනම මත නඩුවක් පැවරීමට අවධානයෙන් සිටින පුරවැසි කණ්ඩායමක් අපේක්ෂා කරයි. කම්හල ඉදි කොට තිබෙන්නේ කාර්මික කලාපයක් තුළ බවත්, මහනගර නගර සභාවේ හා පාරිසරික අධිකාරීන්ගේ සියලුම බලපත්‍ර ලබා ගෙන ඇති බවත්,

මෙහෙයුම් කටයුතු වලින් සිදු වන දූෂණය අවම කිරීම සඳහා පවත්නා සියලු තාක්ෂණික විධි ක්‍රම ක්‍රියාත්මක කොට තිබෙන බවත් කර්මාන්තශාලාවේ තර්කයයි. මෙම කලාපය පදිංචිය සඳහා වූ කලාපයක් නොවන නිසා, ෆැක්ටරිවත්ත නම් ජනාවාසය නීති විරෝධී බවට ද ඔවුන් පෙන්වා දෙයි. කර්මාන්තශාලාව සිය ගණනක් ජනතාවට රැකියා සපයා දෙන බවට වූ කරුණ ද ඔවුන් මතු කරයි.

පුරවැසියන්ගේ පැමිණිලිවලට ප්‍රතිචාර ලෙස, මහනගරයේ නගර සභාව පෙන්වා දෙන්නේ බදු ලෙස අය කරගනු ලබන මුදල්වලින් විශාල පංගුවක් කර්මාන්තශාලාව විසින් තමුන් වෙත ලැබෙන බවයි. මෙම මුදල් නොමැතිව, නගරයේ යටිතල පහසුකම් සංවර්ධනය සහ මහාමාර්ග, කැලි කසල බැහැර කිරීම හා සනීපාරක්ෂාව බඳු වූ වැඩි දියුණු කිරීම් සිදු කල නොහැකි බවට ද නගර සභාව පෙන්වා දෙයි.

මේ අතර කම්හලේ සිදු වූ පිපිරීමක් නිසා ගින්නක් හට ගත් අතර එය ෆැක්ටරිවත්තේ නිවාස භාගයක් පමණ විනාශ කිරීමට හේතු විය. පෙර පාසැලක සිර වී සිටි ළමුන් හත් දෙනෙක් ගින්න නිසා මිය ගියහ.

කර්මාන්තශාලාවට හා නගර සභාවට එරෙහිව නඩු පැවරීමට පුරවැසි කණ්ඩායම අපේක්ෂා කරයි. මෙම සිද්ධිය තුලින් පැන නගින පාරිසරික හා මානව හිමිකම් ගැටලු සහ අදාළ වන්නා වූ නීති හා නෛතික සිද්ධාන්ත කවරේදැ'යි සාකච්ඡා කරන්න.

5. 'සෑම ජනතාවකටම පිරිසිදු, සෞඛ්‍යමත් හා චිරස්ථායී පරිසරයක් සඳහා අයිතිය පවතී. මානව අයිතිවාසිකම් සහ පරිසරය අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතින නිසා, ජීවත් වීමේ අයිතිය, සෞඛ්‍යය, ආහාර, ජලය, සනීපාරක්ෂාව, සංවර්ධනය බඳු වූ පුලුල් පරාසයක අයිතිවාසිකම් සම්පූර්ණ වශයෙන් භුක්ති විඳීම සඳහා පිරිසිදු, සෞඛ්‍යමත්, චිරස්ථායී පරිසරයක් අවශ්‍ය වෙයි'.

[සෞඛ්‍ය සම්පන්න පරිසරයක් සඳහා වූ අයිතිය යනු කුමක්ද? – විස්තර සටහන – UNDP/UNEP/OHCHR]

ශ්‍රී ලංකාවේ හා වෙනත් අධිකරණ පද්ධතිවල අධිකරණ සෞඛ්‍යමත් පරිසරයක් සඳහා වූ අයිතිය පළල් පරාසයක සමාජ-ආර්ථික අයිතිවාසිකම් සමග සම්බන්ධකොට තිබෙන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර තුල නඩු නීතිය උපුටා දැක්විය යුතු වෙයි.

6. මහගල්ල නගරයේ වසර 700 ක පමණ ඉතිහාසයක් තිබෙන පෞරාණික කොටු බැම්මක් පිහිටා ඇත. 1988 වර්ෂයේ දී මෙම කොටුව ලෝක උරුමයක් ලෙස නම් කරන ලද අතර, පුරාවිද්‍යා ආඥා පනත යටතේ පුරාවිද්‍යා සංරක්ෂිතයක් ලෙස ද නම් කොට ඇත.

මෙම කොටු බැම්ම දේශීය ජනයා පදිංචිය සඳහා භාවිතා කළහ. ඔවුන් කොටු පවුර ප්‍රදේශය තුළ නිවාස ඉදි කොට තිබෙන අතර, එහි ජීවත් වීම සඳහා අවසරය ඔවුන් වෙත විය. මෑතකදී, බොහෝ පදිංචිකරුවන් සිය නිවාස විදේශිකයන්ට ඉහළ මිලකට විකුණන්ට පටන් ගෙන තිබෙන අතර මෙම නිවාස හෝටල් හා ආපන ශාලා බවට පරිවර්තනය වේ. කොටු පවුර භූමිය තුළ නිධන්ගතව ඇතැයි සැලකෙන පෞරාණික කාසි හා එබඳු වෙනත් දෑ විදේශිකයන්ට ඉහළ මිලකට විකිණීමේ අරමුණ ඇතිව ඇතැම් පදිංචිකරුවන් පොලොව හෑරීම ද ආරම්භ කොට ඇත. සැලකිය යුතු ලෙසට ගෘහ නිර්මාණ ව්‍යුහය වෙනස් කරමින්, සිය නිවාස ප්‍රතිසංස්කරණය කිරීමට ද ඔවුන් කටයුතු කරමින් සිටිති.

ලාල් සහ නලින් සංස්කෘතික උරුමයන් සුරැකීමේ සමාජයේ සාමාජිකයන්ය. කොටුව තුළ සිදුවන ක්‍රියාකාරකම් පිළිබඳ සැලකිල්ලෙන් සිටින ඔවුන්, පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජනරාල් මෙම කටයුතු නතර කිරීමට ක්‍රියා නොකිරීම පිළිබඳ ද අවධානය යොමු කොට ඇත. කොටුව ප්‍රදේශය තුළ සිදුවන ක්‍රියාකාරකම්වල නෛතික තත්වය පිළිබඳ ඔබගෙන් උපදෙස් ගැනීමට ඔවුන් අපේක්ෂා කරයි.

දේශීය හා අන්තර්ජාතික නීතීන් වෙත සැඳහුම් කරමින් ඔවුන්ට උපදෙස් දෙන්න.

හිමිකම් ඇවිරිණි
*********